**රබර් නැවත වගා සහනාධාර අරමුදල - 2015**

-----------------------------------------------------

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය ව්‍යාචනය**

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

අරමුදල සතුව තිබූ ස්ථාවර තැන්පතු හා ආයෝජන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොකිරීම හා වෙනත් ආදායමක් උපයා නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ආදායම් වියදම් ප්‍රකාශනයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

ඉකුත් වර්ෂයකදී ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු. 70,659,526 ක් අරමුදලින් අඩුකර දක්වනවා වෙනුවට ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

**2.2.3 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම**

**(අ) ජංගම නොවන වත්කම්**

අරමුදල ක්‍රියාකාරීව නොපවතින බැවින් 2014 ජූලි 04 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව අරමුදලේ ශේෂ නිරවුල් කිරීමට පත්කළ කමිටු නිර්දේශ අනුව 2014 වර්ෂයේදී අරමුදල සතුවූ ස්ථාවර වත්කම් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගිණුම්වලින් ඉවත් කර තිබුණි. පවරන අවස්ථාව වනවිටත් වත්කම් පිළිබඳ ලේඛනයක් නොතිබූ අතර දෙපාර්තමේන්තුවට පැවරූ වත්කම් හා එම වත්කම් භාරගත් බවට කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් ගිණුම්වලින් ඉවත්කළ පිරිවැය රු.63,438,232 ක වත්කම් නිවැරදිව පවරා තිබුණේද යන්න තහවුරු කරගත නොහැකි විය.

**(ආ) ජංගම වත්කම්**

(i) විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ වර්ෂ 18 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන එකතුව රු. 15,220,514 ක් වූ අත්තිකාරම් ගිණුම් 12 ක ශේෂ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු හා ඒවා අයවිය යුතු පාර්ශවයන්ගේ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii) මහා භාණ්ඩාගාරයෙන් සහ රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතුව රු.17,353,015 ක් අදාල ආයතන විමසීමෙන් තොරව වර්ෂ 18 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට රැගෙනවිත් තිබූ අතර එම ශේෂ සත්‍ය වශයෙන්ම ලැබිය යුතු ශේෂද යන්න තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(iii) වර්ෂ 18 ක් තිස්සේ ගිණුම්වල දැක්වූ රු. 102,890 ක ලැබිය යුතු ආයෝජන පොලිය 2015 දෙසැම්බර් 31 දිනටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(iv) සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලැබීම් සහ ව්‍යාපෘති අංක 02 යන ගිණුම් දෙකට අදාල පිළිවෙලින් රු. 3,647,219 ක හා රු. 65,477,579 ක ශේෂ පිළිබඳව ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(v) වත්කමක් ලෙස හඳුනාගැනීමට හේතු අපැහැදිලි වූද, අයකර ගැනීම සම්පූර්ණයෙන්ම අවිනිශ්චිත වූද එකතුව රු.351,353 ක් වූ ගිණුම් 5 ක ශේෂද වර්ෂ 18 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි.

**(ඇ) ජංගම බැරකම්**

(i) වර්ෂ 18 කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණු රු.9,988,530 ක විවිධ තැන්පතුවලට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii) ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති වර්ෂ 18 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන රු.57,526 ක වෛද්‍යාධාර ණය හා වෙනත් දෙපාර්තමේන්තු ණය රු.416,313 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) එකම කළමනාකරණයක් යටතේ පැවතියද, රබර් පාලන අරමුදලට ගෙවිය යුතු රු. 281,210 ක් හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.15,449 ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) ගෙවිය යුතු නිශ්චිත පාර්ශවය හා වටිනාකම හඳුනාගෙන තිබුණද, රු.22,087 ක් රබර් පර්යේෂණායතනයට ගෙවා නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(v) වර්ෂ 18 කට පෙර සිට කිසිදු සේවකයකු සේවයේ යොදවා නොමැති නමුත් ගෙවිය යුතු නිශ්චිත පාර්ශවයක් සඳහන් නොවන රු.90,706 ක සේවක පාරිතෝෂික බැදීමක් ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(vi) පැල අත්තිකාරම් සහ පරිණත වගාවට පොහොර යනුවෙන් නම් කළ, පිළිවෙලින් රු.119,550 ක් හා රු.4,779,564 වූ ශේෂ දෙකක් වර්ෂ 18 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන අතර ඒවාට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(vii) අරමුදලට අයත් නොවන ණය ලැබීම් යනුවෙන් සඳහන් රු.3,096,701 ක ජංගම බැරකමක් ලෙස දක්වා තිබුණද, එම අසාමාන්‍ය බැදීම ඇතිවීමට හේතුව හෝ එම මුදල් ගෙවිය යුතු පාර්ශව කවරේද යන්න පිළිබඳ තොරතුරු හෝ විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------

### 3.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

2013 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් ඉතිරි කිරීමේ තැන්පතු සඳහා පොළී ආදායමක් ලැබී තිබුණු අතර එය අරමුදලේ එකම ආදායම් ප්‍රභවය විය. ඉකුත් වර්ෂය ආරම්භයේ දී අරමුදල සතු සියළුම බැංකු තැන්පතු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට බැර කර තිබුණු අතර ඒ අනුව අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

#### 3.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

------------------------------------------------------

2009 ජුලි 23 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී අරමුදල ඇවර කිරීමට නියෝග කර ඇතත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 26 දිනදීය. 2016 මාර්තු 17 දින අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඇවරකරුවකු පත්කර තිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට අනුකූලව අරමුදලේ කටයුතු ඇවර කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක සම්බන්ධ කරගෙන සිදුකර නොතිබුණි.

## 4 පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් හා ලැබිය යුතු ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.